# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2122/40 – 2019 මැයි 09 වැනි බ්‍රහස්පතින්දා – 2019.05.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බත්තරමුල්ල (කඩුවෙල මහ නගර සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/ඩීඑස්ඕ/2017/823 හා 2018.01.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ගොඩැල්ලවත්ත නොහොත් මිල්ලගහවත්ත සහ කොට්ටනුවේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.3221ක් පමණ**

උතුරට: ඇළ සහ කඩුවෙල පාරේ වරි. අංක 21/1 දරන ඉඩම; නැගෙනහිරට: කඩුවෙල පාරේ වරි. අංක 21/1, 15, 19/2 දරන ඉඩම්; දකුණට: කඩුවෙල පාරේ වරි. අංක 15, 19/2 සහ 11 දරන ඉඩම් සහ මාර්ග (මා.සං.අ.); බටහිරට: රජයේ ඉඩම සහ ඇළ.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/11/2017/යූඩීඒ/34.
2019 අප්‍රේල් මස 09 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 - 583

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප

වගන්තිය යටතේ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩ පළාත කෝරලේ සුළු කොට්ඨාසයේ, හෙවනකුඹුර (50ඒ) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හෙවනකුඹුර (කොටසක්) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක බී/ඒසීකිව්/ඩබ්ලිව්එල්එම්/2018/41 හා 2018.06.13 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – අඹේවෙලවත්ත (තවාන කොටස) – ප්‍රමාණය: හෙක්. 0.9284 ක් පමණ**

උතුරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන අඹේවෙලවත්ත (හි.පි. 50247) සහ අ.ග.පි. 513 හි කැබලි අංක 115; නැගෙනහිරට: අ.ග.පි. 513 හි කැබලි අංක 115, 117 සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන අඹේවෙලවත්ත (හි.පි. 50247); දකුණට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන අඹේවෙලවත්ත (හි.පි. 50247) සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන අඹේවෙලවත්ත (හි.පි. 50247) සහ මාර්ගය (මා.සං.අ.).

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2017/පීසී/518.
2019 මාර්තු මස 16 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 - 584

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.